2022 SEP 30
LANKAYOUTH CHAT
LANKAYOUTH
Since : 2011



# නිරූපණ ශිල්පියෙක් වීම ආඩම්බරයක්

## නිපුන් මධුමාල් හසරංග

අනුර ප්‍රේමකුමාර
පිටුසැකසුම Lankayouth.com

**නම:** නිපුන් මධුමාල් හසරංග
**ගම :** හෝමාගම
**පාසල :** හෝමාගම ජනාධිපති විදුහල, ලුම්බිණි විද්‍යාලය - කොළඹ 05

**පවුලේ විස්තර**
පවුලේ අම්මයි, තාත්තායි මමයි ඉන්නේ. පවුලේ එකම දරුවා මම.

**ඔබ ගැන කෙටියෙන් කිව්වොත්**
මම හිතනවා මම නිහතමානී මනුස්සයෙක් කියලා. ඕනෑම වෙලාවක මම මිනිස්සුන්ට උදව් කරනවා. මම මගේම ව්‍යාපාරයක් කරන ගමන් ඉගෙන ගන්නවා තවම. ඒ වගේම මම නිරූපණ ක්ෂේත්‍රයේ නියැලෙනවා. ITN අවුරුදු කුමාර - 2022 අවසන් 30 දෙනා අතරටත් මම ආවා

**කලා ක්ෂේත්‍රයේ ඔබ නියෝජන කරන ක්ෂේත්‍රය කුමක්ද?**
නිරූපණ ක්ෂේත්‍රය

**නිරූපණ ශිල්පියෙක් විදිහට මේ වෙද්දි කර ඇති**

**නිරූපණයන් ගැන කතා කළොත්.**
දැනට පොටෝෂූට් දහයකට ආසන්න සංඛ්‍යාවක් කරලා තියෙනවා. ඉන් පහක්ම මගේ තනි පොටෝෂූට්.

**නිරූපණ ශිල්පියෙක් වීම ගැන මොකද හිතෙන්නේ.**
සතුටුයි... නිරූපණ ශිල්පියෙක් වීම ඇත්තටම මට නම් ආඩම්බරයක්.

**ඔබ වෘත්තීය නිරූපණ ශිල්පියෙක්ද?**
ඔව්... මම වෘත්තීයක් විදිහට නිරූපණ ක්ෂේත්‍රයේ නියැලෙනවා.

**වත්මන් නිරූපණ ක්ෂේත්‍රය ගැන මොකද හිතෙන්නේ.**
ඇත්තටම සතුටු වෙන්න පුළුවන් දැන් තියෙන තත්ත්වයත් එක්ක. හොඳ ක්ෂේත්‍රයක් වෙලා ඉවරයි නිරූපණ ක්ෂේත්‍රය. හොඳ නිර්මාණ කරලා මේ ක්ෂේත්‍රය තවත් ඉස්සරහට හොඳ නමක් හදාගන්න අපි හැමෝම එකතුවෙලා වැඩ කරන්න ඕනි.

**රංගනය පැත්තට යොමු වන්න අදහසක් නැත්ද?**
තියෙනවා... රංගනයටත් මම ගොඩක් ආසයි. හොඳ නිර්මාණ මම භාරගෙන රංගනයේ යෙදෙනවා දැනටමත්. ඒ වගේම මගේම යූටියුබ් නාලිකාවක් කරගෙන යනවා මම. එහිත් මම රංගනෙයන් දායක වෙනවා. ඊට මගේ යහළුවන්ද සම්බන්ධ වෙනවා. මගේ යූටියුබ් චැනල් එක තමයි Nippa Studio කියන එක. මේ හරහා මගේ රංගන කුසලතාවයන් දැකබලා ගන්න පුළුවන්.

**රංගනයට අවස්ථාවක් ලැබුණහොත් ඔබ චරිත තෝරා ගන්නේ කෙසේද?**
චරිත තෝරා බේරාගෙන රඟපාන්න මම කැමැති නැහැ. හැම චරිතයක්ම හොඳ චරිතයක්. මට ඒ හම්බවෙන චරිතයට සාධාරණයක් කරන්න පුළුවන් කියලා හිතුනොත් මම භාරගන්නවා.

**නිරූපණය සහ රංගනය ගැන ඔබගේ අදහස?**
නිරූපණයයි රංගනයයි දෙකම හරි ආසාවෙන් කරන්න පුළුවන් ක්ෂේත්‍ර දෙකක්. හැබැයි රංගනයට හොඳ හැකියාවක් තියෙන්න ඕනි කියලා මට හිතෙනවා. මොකද චරිතයට අපි ඇතුල්වෙලා රඟපාන්න ඕනි.

**මේ වන විට පැමිණි ගමන ගැන තෘප්තිමත්ද?**
ඔව්... ඇත්තටම සතුටුයි. හැබැයි මට තවත් නිරූපණ ක්ෂේත්‍රය ගැන ඉගෙන ගන්න ඕනි. ඒ ගැන මම තවත් අධ්‍යයනය කරන ගමන් තමයි ඉන්නේ.

**මෙම වැඩකටයුතුවලට පවුලේ අයගෙන ලැබෙන සහයෝගය.**
මගේ අම්මාගෙන් තාත්තාගෙන් ලොකු සහයෝගයක් ලැබෙනවා මට. එයාලා මට කවදාවත් බාධා කරලා නැහැ. මම නිරූපණ ක්ෂේත්‍රයේ නියැලෙනවටත් එයාලාත් කැමැතියි. ඒ ගැන මට සතුටුයි.

**නිරූපණය සහ රංගන යන ක්ෂේත්‍රයන් දෙකෙහිම ඉදිරියටත් කටයුතු කරනවද?**
ඔව්... ඉදිරියටම යන්න තමයි බලාපොරොත්තුව. මේ ක්ෂේත්‍රයේ හොඳ නමක් හදාගෙන ඉන්න තමයි ඉදිරියට බලාපොරොත්තු වෙන්නේ.

**ගමනට සහයෝගය ලබාදෙන පිරිස ගැන කිව්වොත්.**
ඔව්... මට ලොකු පිරිසක් සහය වෙනවා. මගේ දෙමාපියන්, යාළුවෝ ඇතුළුව. හැම කෙනාගේම නම් වෙන් වෙන්ව කියන්න ගියොත් ලොකු ලිස්ට් එකක් ලියන්න වෙනවා. ඒක නිසා පොදුවේ හැමෝම මතක් කරනවා. ඒවගේම ඡායාරූප ශිල්පීන් මට ගොඩක් උදව් කරලා තියෙනවා. ඒ අතරින් ඡායාරූප ශිල්පී භාෂිත වික්‍රමපාලව විශේෂයෙන් මතක් කරන්න ඕනි. ආටිකල් එක ලියන අනුර අයියාත් මට මේ කරන්නේ ලොකු උදව්වක්.

**අනාගත බලාපොරොත්තු ගැන කිව්වොත්.**
අනාගතයේ නිරූපණ ශිල්පියෙක් විදිහට හොඳ නමක් හදාගෙන ව්‍යාපාර කටයුතුවලින් අධ්‍යාපනයෙන් ඉහළටම යන්න තමයි මගේ එකම බලාපොරොත්තුව.

